චක්‍රලේඛ අංක : 07/2012

මගේ අංකය: බප/සසේකො/6-චක්‍රලේඛ
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප),
අංක 121/3, කිරුළපන මාවත,
කොළඹ 05.
2012. 12 . 31

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා
සමූපකාර සමිති,දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු ,
සණස සමිති හා අනෙකුත් සියළුම
ලියාපදිංචි සමිති වල
ගරු සභාපතිවරුන් වෙත,

## වයස අවුරුදු 57න් ඔබ්බට සේවකයින්ගේ සේවා දීර්ඝ කිරීමේ අවශ්‍යතාවය ඉවත් කිරීම

බස්නාහිර පළාත් සමූපකාර සේවක කොමිෂන් සභාවේ ස්ථිර කරන ලද සියළුම සමූපකාර සේවකයින්ගේ සේවා කාලය අවුරුදු 57න් ඔබ්බට දීර්ඝ කිරීමේ දි පහත සඳහන් ජාතික ප්‍රතිපත්ති අදාළ කරගත යුතු බව බස්නාහිර පළාත් සමූපකාර සේවක කොමිෂන්සභාව විසින් තීරණය කර ඇත.ඒ අනුව කොමිෂන් සභාවේ ස්ථිර සමූපකාර සේවකයින් විසින් වයස අවුරුදු 57න් ඔබ්බට සේවා දීර්ඝ ලබා ගැනීම සඳහා ඉල්ලුම් කිරීමේ අවශ්‍යතාවය ඉවත් කරනු ලබන අතර ඔවුන් සම්බන්ධව පහත සඳහන් පරිදි කටයුතු කරනු ලැබේ.

01. කිසියම් සේවකයෙකු වයස අවුරුදු 57ක් ඉක්මවා සේවයේ යෙදීමට අදහස් කරන්නේ නම් සේවා දීර්ඝ කිරීමේ ඉල්ලීමක් නොමැතිව අනිවාර්යය විශ්‍රාම ගැන්වීමේ වයස දක්වා සේවයේ රැදී සිටීමට ඉඩ ලබා දීම.

02. අවුරුදු 55 සිට 60 අතර දී සේවකයාගේ අභිමතය පරිදි මාස 03 කල්දීමක් කර විශ්‍රාම යැමේ අයිතිය ලබා දීම.

03.කාර්යක්ෂමතාවය හා කාර්යය සාධනය සතුටුදායක නොවන සේවකයෙකු හට වයස අවුරුදු 57න් ඔබ්බට සේවය දීර්ඝ කිරීමක් ලබා නොදීමට අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරන්නේ නම්, එයට එරෙහිව සේවකයාට අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සැලසෙන ආකාරයෙන් මාස 06ක කල් දීමකින් පසුව විශ්‍රාම ගැන්වීමේ බලය පත් වීම් බලධාරියා වෙත පැවරීම.

04.සේවකයාට එරෙහිව විනයානුකූල කටයුතු සිදු කෙරෙමින් පවතින විටක හෝ විනයානුකූල කටයුතු කිරීමට අදහස් කර ඇති විටක ඒ පිළිබඳව අවධානය යොමු කරමින් විශ්‍රාම ගැන්වීමට කටයුතු කළ යුතු වේ.

මේ සම්බන්ධයෙන් නිකුත් කර ඇති අංක 5/96 ,6/2005,6/2005(i), 6/2005(ii) සහ 6/2009 යන චක්‍ර ලේඛ මෙයින් අවලංගු කරනු ලැබේ.

මෙම චක්‍රලේඛය සියළුම සේවකයින්ගේ අනුදැනුමට ඉදිරිපත් කල බව තහවුරු කර ගැනීම සඳහා මෙහි පිටපතක් සියළුම ස්ථිර සේවකයිනගේ අත්සන් සහිතව ගොනු කර තබා ගැනීමට සමිති විසින් ක්‍රියා කල යුතුයි.

කොමිෂන් සභාවේ නියමය පරිදිය.

අයි.ආර්.සෝමසිරි,

ලේකම්,

සමුපකාර සේවක කොමිෂන් සභාව,

බස්නාහිර පළාත.

පිටපත් - 01. ප්‍රධාන ලේකම් - බ.ප

02. ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් සහ ග්‍රාම සංවර්ධන කටයුතු පිළිබඳ අමාත්‍යාංශ ලේකම් - බ.ප

03. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් - බ.ප

04. සමුපකාර සේවක කොමිෂන් සභාව -ලේකම්

05. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්

06. සියළුම වෘත්තිය සමිති සංගම්